# රඟ මඬල

කලාභූෂණ ගත්කතුවර. සංගීතඥ ශ්‍රී ලංකා ගුවන් විදුලි සේවයේ විශිෂ්ඨ ශ්‍රේණියේ ගායන හා වාදන ශිල්පී.
**ලයනල් ගුණතිලක ලියයි**



**ශ්‍රී ලංකාවේ ටවර් හොල් යුගයේ, එනම් වර්ෂ 1911 සිට සිංහල නූර්ති නාට්‍ය කලාව පෝෂණය කළ නාට්‍යකරුවන්, සංගීතඥයින් හා නළු නිළියන්ගේ අප්‍රකට අනගි තොරතුරු අන්තර්ගත ලිපි මාලාව**

## ආචාර්ය යූ.ඩී. පෙරේරා

සංගීතඥයෙකු, නාට්‍ය කතුවරයෙකු, ගීත නිබන්ධකයෙකු ගායකයෙකු වූ මෙතුමාණන්ගේ සම්පූර්ණ නාමය උඳුගොඩ හේවාපන්නලාගේ ධර්මසිරි පෙරේරා නම් වේ. හෙතෙම උපත ලබා තිබෙන්නේ බණ්ඩරගම නගරයට නුදුරු වීදාගම නම් ගම් පියසේය. එනම් 1902 ජනවාරි 02 වන දින දීය. වයස අවුරුදු 9 දී එකල බෙහෙවින් ජනප්‍රිය වෛශාකා බැතිගී (කැරොල්) ගායන වලට සහභාගි වී කලා ලොවට පිවිසීය. වයස අවුරුදු 15 දී මොනිටර් විභාගයෙන් සමත් වී පානදුර මහානාම විදුහලේ ගුරුවරයෙකු සේ සේවය කර ඇත.

එකල චිරප්‍රසිද්ධ නාට්‍ය කතුවරයෙකු වූ බී.ඇල්. බෝධිපාල විද්වතාණන් ඇසුරෙන් සිංහල භාෂාව මනාව ප්‍රගුණ කර ගීත නිබන්ධනයට යොමු වූයේ වර්ෂ 1928 දීය. ඉහත සඳහන් කළ බෝධිපාල සූරීන් හා යූ.ඩී. පෙරේරා සුසංයෝගයෙන් ගීත නිබන්ධනය කර දෙන ලද්දේ පාර්ලෆෝන් නමැති ග්‍රැම ෆෝන් තැටි සමාගමටය. එම තැටි නිෂ්පාදනයට දායක වී තිබෙන්නේ ප්‍රසිද්ධ වෙළඳ ව්‍යාපාරික ඇන් පොරෝලිස් ප්‍රනාන්දු මහතාණන් සමග ඇති කර ගත් ගිවිසුමක් පරිද්දෙනි. දිවංගත අමරණීය ගායක පණ්ඩිත් ඩබ්.ඩී. අමරදේවයන්ට ප්‍රථම ග්‍රැමෆෝන් ගීතය රචනාකර දී තිබෙන්නේද යූ.ඩී. පෙරේරා සූරීන් විසිනි. මෙ ගීතයේ මුල් වචන පේලියේ මෙසේ දක්වමි. ''රසයි නෑ කිරි දියාරු'' ආදී වශයෙනි. පාසු කල ලංකාවේ ජනප්‍රිය ග්‍රමෆෝන් තැටි නිෂ-
"පාදනය කරන සමාගම් දෙකක් වූ එච්.ඇම්.වී. හෙවත් හිස් මාස්ටර් වොයිස් :ඍසි වීඑ‍ැර ඞදසප්ජ* සහ :ඣදකදපඉස්* යන සමාගම් ප්‍රසිද්ධියට පත්වූහ.

කොලොම්බියා තැටි සමාගමේ ගීත නිබන්ධකයා මෙන්ම ගායකයෙකු වශයෙන් යූ.ඩී. පෙරේරා සූරීන් ග්‍රැමෆෝන් ගීත සාහිත්‍යයට අමරණීය සේවාවන් රාශියක් ඉටුකර තිබේ. කොලොම්බියා ගීත සඳහා සංගීත අධ්‍යක්ෂණයෙන් අගනා මෙහෙවරක් සිදු කරන ලද්දේ භාරතයෙන් අප රටට පැමිණ සිටි ප්‍රොෆෙසර් මෙහොමඩ් ගවුස් සංගීතවේදියා විසිනි. එතුමන්ගේ සංගීත සංයෝජන කොතරම් කර්ණ රසායනද යන්න එම ගීත ශ්‍රවණයෙන් මනාව වටහා ගත හැක. එමෙන්ම එකල අතිශයින් ජනප්‍රිය වූ අශෝකමාලා චිත්‍රපටයේ ගීත නිර්මාණය කළේද මෙතුමාය. එම ගීත ශ්‍රවණය වන විට ශ්‍රවණෙන්ද්‍රියන් පිනවන බව අවිවාදයෙන් පිළිගත හැක.

එතුමන් විසින් ජාතියට හඳුන්වා දුන් ගායක ගායිකාවන් අතරින් අල්හාජ් මොහිදීන් බෙග්, කේ.කේ. රාජලක්ෂ්මි, අහමද් මොහිදීන්, ඒ.ආර්.ඇම්. ඊබ්‍රාහිම්, ඒ.ඇම්.යූ. රාජ්, ඇබ්.බී. යොහර්ෂා වැනි අන්‍යලබ්ධිකයින් මෙන්ම සිංහල බොදු ගායක ගායිකාවෝද සිටිති. ග්‍රේටා ජැනට් සිල්වා, පීටර් සිරිවර්ධන, විල්ප්‍රඩ් ජේ. පීරිස්, රෙජිනා පෙරේරා, අශෝකදේවි, ටයිටස් සමරවීර, එඩී ජූනියර්, වසන්තා සන්දනායක, ඩබ්. මධුරාවතී, දොන් හෙන්රි, සිසිලියානා ඩයස්, හෙන්රි ෆොන්සේකා, එඩී ජයමාන්න යන ගායක ගායිකාවෝ ඒ අතර වෙති.

කොලොම්බියා සමාගමට බඳවාගත් ඒ.ආර්.එම්. ඊබ්‍රාහිම් නම් මුස්ලිම් ගායකයා විසින් බොදු ගීත රාශියක් ගායනා කර ඇත. එකල ගායකයෙකුට ගීතයක් ගායනා කළ විට ගෙවනු ලබන්නේ රු. 5/- කි. එකල එම මුදල වටිනාකමින් වැඩිය. වත්මන් මිල සමග සන්සන්දනය කළ විට එහි අගය රු. 5000/- ටත් අධිකය. ඔහු විසින් ගැයූ ''සුන්දර ශ්‍රීනි මනහාරි, කුසිනාරා නගරෙයේදී'' යන ගීතය කෙතරම් ජනප්‍රිය වූයේද යත් එම තැටි අනූ පන්දහසක් අලෙවි වී තිබුණි. ඉන් අමන්නදානන්දයට පත් එම සමාගම එම ගීතය ගැයූ ඊබ්‍රාහිම් ගායකයා කැඳවා උත්සවයක් පවත්වා රු. 5000/- ක් පරිත්‍යාග කළ බව ඉතිහාසයේ සඳහන් වී තිබේ.

ග්‍රැමෆෝන් ගීත වලට අමතරව එකල නාට්‍ය දෙබස් හා ගීත ඇතුළු තැටි නිශ්පාදනය කරනු ලැබීය. ඒවා අතිශය ජනප්‍රිය වූ බව මෙම ලේඛකයාද සාක්ෂි දරයි. ''කොණ්ඩේ ඉරණම, ශ්‍රී වික්‍රම, විදු'' යනාදී ගීත තැටි ඒවා අතර වේ. යූ.ඩී. පෙරේරා ශූරීන් විසින් රචිත කුවේණි නාට්‍යයේ යුග ගීතයක් පළමු වරට ග්‍රමෆෝන් තැටියකට ගයන ලද්දේ අල්හාජ් මොහිදීන් බෙග් ගායකයා හා කේ.කේ. රාජලක්ෂ්මි නම් ගායිකාවය. ''කරුණා මූදේ නාමු ගිලීලා ප්‍රේම මනෝහර ගීත ගයාලා'' එකල ඉතා ජනප්‍රිය වූ ගීතයකි. මොහිදීන් බෙග් ගායකයාගේ මුල්ම ජනප්‍රිය වූ ගීතය වූයේද එම ගීතයයි.

අප රට බෞද්ධ ජනයා ආගමික වතාවත් වලදී නිරතුරුවම යොදා ගනු ලබන ''නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස'' යන පාලි ගාථා පාඨය මුල් වරට නමස්කාර පූර්වකව වන්දනා කළේ කවුරු කවුරුන්ද යන්න එම ගීත රචනයෙන් මනාව පෙන්වා දී තිබීම අති ප්‍රශංසනීය බව නම් නොකියා නොහැකිය.

අප තථාගත සම්බුදු රජාණන් වහන්සේට නමෝ කියා වැන්දේ කවුරුන්ද? තස්ස කියා වැන්දේ කවුරුන්ද? භගවතෝ කියා වැන්දේ කවුරුන්ද? අරහතෝ කියා වැන්දේ කවුරුන්ද? සම්මා සම්බුද්ධස්ස කියා වැන්දේ කවුරුන්ද? යන්න පැහැදිලි ලෙස තේරුම් ගත හැකි පරිදි රචනා කර ඇති බව සක්සුදක් සේ පැහැදිලිය.

අපි ගීතය කියවා බලමු. ''නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස" සෑසි සිරිපා වන්දනා කෙරුවේ කවුරුද නමෝ කියා. සාතගිරි නම් යක්පති පැහැදී වැන්දේ නමෝ කියා. පා දයා දේවාතී දෙව් ස්වාමී තස්ස කියා මුණි කවුරුද වැන්දේ චේප චිත්ත සුරින් වැන්දේ ඒ සිදි පාද කමල් මකරන්දේ සියළු සතට දුන් ශාක්‍ය සුගන්දේ, සාදු සාදු භගවතෝ කියාලා සිව්මහ රජවරු පිදු සිරිපා මෝක්ෂ පතාලා පිදු සිරිපා, සක්දෙව් පිදු අරහතෝ කියාලා සහම්පතී බඹු පිදු සිරිපා සම්මා සම්බුද්ධස්ස කියා. ලෝක නාත සාක්‍ය සාමි වඳිමූ හා... හා......හා ..........

එම ගීතය ගයා ඇත්තේ යූ.ඩී. පෙරේරා ශූරීන් සමග කේ.කේ. රාජලක්ෂ්මි ගායිකාවය. තනුව මොහොමඩ් ගවුස් සගීතඥයාගේය. එම ගායිකාවද අන්‍යලබ්ධික කාන්තාවකි. එපමණක් නොව බෞද්ධ සාහිත්‍යයේ වැදගත් අවස්ථාවන් උද්දීපනය වන සේ රචනා කර ඇති ගීත රාශියක් ජාතියට තිළිණ කර ඇති බව පහත සඳහන් ගීත සංඛ්‍යාව අනුව පැහැදිලි වේ.

''සිළුමිණ සෑය වඳින් රම්‍ය තවුතිසා භවනේ'' ගීතයේ අන්තරා කොටසේ අනෝම ගං තීරයේ සිසිල් ජලය උපමා කර ඇති අයුරු විමසා බලන්න. ''නිල් සිසිල් ජලයෙන් සොබනා'' මෙම හරවත් උපමාව යෙදීම පිළිබඳව දිවංගත ගේය පද රචක මහගමසේකර සූරීන් වෙසින් කදිම නිදසුනක් පෙන්වා දී තිබේ. අනෝම ගඟේ දිය දහරාව (මැණික් කන්දක්) දිය වෙව් ගලා යන්නක් මෙන් යොදා තිබීම ගං දියේ නිල් පැහැයත්, සීතල බවත්, නිර්මල බවත් යන කරුණු සියල්ල එහි ගැබ්වී තිබීම ප්‍රසංශනීය බව පෙන්වා දී ඇත.

මෙතුමන් විසින් සිදුකර තිබෙන සුවිශේෂී කාර්යය නම් මුස්ලිම්, මැලේ, දෙමළ ගායක ගායිකාවන් ලබා බුද්ධාලම්භන ප්‍රීතිය දනවන ගීත රාශියක් ජාතියට තිළිණ කර තිබීමයි. බෞද්ධ සාහිත්‍යයේ විවිධ අවස්ථාවන් ඉතාමත් විචිත්‍ර ලෙස රචනා කර එම ගීත අන්‍යලබ්ධිකයන් ලබා ගායනා කරවා විෂයාත්‍රිකාන්ත භාවය නොවන්නේද? ඒ බව තව තවත් පසක් වනුයේ පහත දැක්වෙන බොදු ගීත මාලාවේ මුල් වචන ලෙස විමසුම් මනසකින් බැලීමෙනි. ''නැව් ගිලීලා අන්ධකාරේ ඒ මහ සේනා සාගරේ'' ''නිර්වාණේ ධර්ම රසින් අසමානේ'' පා පද්මේ සුදිස්නා සුරබඹුන් මතේහි'' ''සසර පරාදේ නැත පරමාදේ'' ''ලෝනාථා ගෞතම වැඩසිටි කාලේ ඉසිපතනාරාමේ'' ''මුණි නන්දන සිරි පාද වඳිමු'' ''නාමේ නොදිරනා කුණු කය දිරනා'' ''දුල් සල් වනේ ලකල්'' ''ක්‍රිෂ්ණජිනා හා ජාලිය දෙදෙනා'' ''බුදු සසුණ බැබලේවා'' ''රාජ සඟබෝ හිස දී දුගියාටා'' යනාදී ගීත සමුච්චය ඊට සාක්ෂි දරයි. මෙම ගීත සමුච්චය ඇතුළු තවත් එවැනිම බෞද්ධ ග්‍රැමෆෝන් ගීත රසවිඳිනට කැමැත්තක් ඇති සංගීත විෂය හදාරන්නන් හට හෝ රසිකයින් හට ඇවැසිනම් ඇස්. ගොඩගේ ප්‍රකාශනයන් වන මෙම ලේඛකයා විසින් ප්‍රස්ථාර කර මුද්‍රණය කරන ලද ''කථා පෙට්ටියේ ගී'' ''පැරණි රසාංග' යන කෘතීන් පරිශීලනය කරන්න.

අධ්‍යාපනයට මෙන්ම සංගීත කලාවට යොමු වෙමින් ග්‍රැමෆෝන් යුගයේ සංගීතාවලියට ඉමහත් සේවාවන් රාශියක් ඉටුකළ මෙම විද්වත් ගුරුවරයා, ගීත නිබන්ධකයා, නාට්‍ය රචකයා, ගායකයා වර්ෂ 1976 - 12 - 02 වන දින ලක්වැසි රසික ජනතාවගේ සෝ සුසුම් මැද ජාතියෙන් සමුගත්තේය.